# බතින් රට සරු කෙරුමට දිරිදෙන බතලගොඩ

**රටට අළුත් වී වර්ග හඳුන්වා දුන් බතලගොඩ මධ්‍යම වී අභිජනන ආයතනය නිහඬව මහඟු සේවයක් ඉටු කරන ආයතනයක්. පසුගියද මෙහි සේවයෙන් බැහැර ගිය ආචාර්ය හෙක්ටර් වීරරත්න මහතා මෙරට වී ගොවිතැන කරන තුරු අමතක නොවන බව එහි වත්මන් කාර්ය භාර නිලධාරී ආචාර්ය සේනාධීර මහතා පවසයි.**

**අළුත් වී ජාති ගැන ආයතනය සමග සමීපව තොරතුරු හුවමාරු කිරීමට ගොවි මහත්වරු දැනට වඩා උනන්දු විය යුතුම බවද ඔහු කීවා.**

හීනටි, හීන්දික්කි, ඇල්වී, මාවී, සුවඳැල්

එච් 4, එච් 5, එච් 7, බීජී 11, බීජී 34–8, බීජී 90–2

''ශ්‍රී ලංකාවේ බීජී 90–2 1975 වර්ෂයේ ලෝකයේ වැඩිම අස්වැන්නක් ලබාදුන් වී වර්ගය බව පිලිපීනයේ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය වාර්තා කරයි.'

මුලින් කියැවෙන්නේ සිංහල වී. ඊළඟට අළුත් වී ජාති කියලා හැමෝම දන්නවා. ඒ වගේම ඊළඟට එන ප්‍රවෘත්තියෙන් අවුරුදු දහස් ගණනක් වන අපේ වී ගොවිතැනේ එතෙක් මෙතෙක් කතාව කැටිකර දක්වන බවත් දන්නවාට සැකයක් නැහැ.

බීජී 90–2, විස්කම් වී වර්ගයක් ලෙස දැන් අපේ ගොවි මහත්වරු අතරට ඇවිත්. රටේ කුඹුරු වැඩි හරියක වපුරන්නේ බීජී වී. බීජී කියන්නේ මොකක්ද. මේ අකුරු දෙක පිටුපස වන කතාව අහන්න අපි පසුගියද බතලගොඩ ගියා.

කුරුණෑගල – අනුරාධපුර පාරේ නිසල පරිසරයක තමයි බතලගොඩ තියෙන්නේ. බීජී උපත ලැබුවේ මෙහේදී. බීජී වී ජාතිය අපේ මුතුන් මිත්තන්ගෙන් ලැබුණු එකක් නෙවි. ඒක අලුතෙන් හදගත්ත වී ජාතියක්. බතලගොඩ නිපැයුමක් බව අහවන්න තමයි එහි මුල් අකුරු අරන් බීජී කියලා කියන්නේ. බතලගොඩ කතාව එහේදී කිව්වේ එතැන කාර්ය භාර නිලධාරී ආචාර්ය සේනාධීර මහත්තය.

වටපිට බැලුවම පේනව වගේ අපිත් ඉතින් වී ගොවිතැන් තමයි කරන්නේ. සේනාධීර මහතා බතලගොඩ කතාව පටන්ගත්තා.

අපේ වියලි හා අන්තර්කලාප සඳහා බිත්තර වී හදල දෙන්නයි මෙහේ වැඩ පටන් අරන් තියෙන්නේ. ඒ 1939 දී. මුතු සම්බා පොන්-කාලි, වෙල්ලේ ඉලන්කායි වගේ වී මෙහේ ගොවිතැන් කරලා බිත්තර වී හදලා දුන්නා.



සිංහල වී වගාකළ කුඹුරක්

දෙවන ලෝක යුද්දේ ඉවරවෙලා ටික කලකින් අපේ ගොයම කොළපාළු රෝගෙට ගොදුරුවෙලා. ඔය කාලේදීම වගෙ අපේ පුරුදු වී ජාතිවලින් ලබන අස්වැන්නත් මදි බව වගකිව යුත්තන්ට තේරිලා තියෙනවා. අක්කරයකින් බුසල් **20–25** වාගේයි අරන් තියෙන්නේ. මේ ප්‍රශ්න දෙකට විසැඳුමක් කල්පනා කරද්දී තමයි අපේ කටයුතු නව මගකට යොමුවෙලා තියෙන්නේ. බිත්තර වී හැදීමට අමතරව අළුත් වී ජාති හැදීම.

**අළුත් වී හැදීමට තමයි විද්‍යානුකූලව අභිජනනය' කියන්නේත්.**

ඒ අනුව අවුරුදු ගණනාවක් නොයෙකුත් වී ජාති එකිනෙක දෙමුහුන් කරලා බලලා. පස්සේ ඉන්දුනීසියානු වී ජාතියක් වන මාර්ස් හා අපේ මුරුංගකායන් දෙමුහුන් කරලා. එහෙම හදගත්ත අළුත් වී කොළපාළු රෝගයට ඔරොත්තු දුන්නා. ඒ වගේම අස්වැන්නත් වැඩියි. අක්කරයකට බුසල් 60–70 ක් තරම. 1953–54 තරමේ අපේ ගොවි මහත්වරුන් අතර එච් 4 නමින් බෙදා දුන්නේ මේ වී ජාතියයි. ලංකාවේ හැම තැනකම වාගේ වගා කරන්න පුළුවන් වීම එච් 4 රටපුරා පැතිරෙන්න එක් හේතුවක්. සේනාධීර මහතා බතලගොඩ වී නිපදවීම නැතිනම් අභිජනනයට බැස්ස හැටි විස්තර කළේ එහෙමයි.

## අළුත් වී

ඔය විදියට අළුත් වී ජාති හදන්නේ මොන අදහසක් මුල්කර ගෙනද? අප ප්‍රශ්නයක් නැගුවා. අපි දූන් මේකට නැඹුරුවුන හැටි කිව්වානේ. අභිජනනයට ලක් වන වී ජාතිවල නොයෙක් ගතිගුණ තියෙනවා. අපි ජාති දෙකක් ගනිමු. ඒ දෙක දෙමුහුන් කරලයි අළුත් වී හදන්නේ. ඉතින් එකක හුඟාක් හොඳ ගතිගුණ තියෙනවා. අනිකේ ටිකක් අඩුවෙන් තියෙනවා. එක්කෝ නරක වැඩියි. ඉතින් අපි පුළුවන් තරම් හොඳ ගති වැඩි වෙන වී ජාතියක් ලැබෙනතුරු පරීක්ෂණ කරනවා. වැඩි අස්වැන්න, ලෙඩ රෝග වලට ගොදුරුවන අයුරු, පෝර භාවිතයට අනුව ගසේ වැඩීම, දේශගුණය, පස, පඳුරු, දැමීම, වගා කරුවා හා වගා පිළිවෙත් ආදිය අපි සැළකිල්ලට ගන්නවා.

**අළුත් වී බෙදා දෙන්නේ කොහොමද? මූලික වශයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින්. ඒ යටතේ ලියාපදිංචි බිත්තර වී ගොවි මහත්වරුන් ඉන්නවා. දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්යාල හා නිලධාරි මහත්වරු වැනි මාර්ගවලින් වී ලබාගන්න පුළුවන්. ඔය විදියට තමයි හැට ගණන්වල අපි එච් 4, එච් 5, එච් 7, එච් 8, එච් 9 වගේ වී බෙදා හැරියේ.**



**පරාගණය කළ වී කරලක් සේනාධීර මහතාගේ පරීක්ෂණයට ලක්වේ**

දැන් පොඩි ප්‍රශ්නයක් අපිට මතකයි ගොවි මහත්වරු ඉස්සර අළුත් වී ජාති වලට දෙස් කිව්වා. ඒකේ ඇත්තක් තියෙනවාද?

ඇත්තක් කියන්නේ මෙහෙමයි. ඇත්තටම අළුත් වී ජාති ගැන – ඒවායේ හොඳ හෝ නරක. නැතිනම් තමන් අත්දැකපු විශේෂ ලක්ෂණ අපිට දන්නවා නම් හුඟාක් වැදගත්. ඔය එච් 7 බෙදදීපු කාලේ පැමිණිලි ආවා. මේක කල් තියාගන්න බැහැ. බොල් වැඩියි. දිරනවා. ඉපියෝ වහනවා. අපි මේ ගැන හෙව්වා. කාරනේ ඇත්ත. එච් 7 වී වල පොත්ත තුනියි. අර දේවල් වෙන්නේ පොත්ත තුනී නිසයි. ඉතින් අපි එච් 7 බෙදහැරීම නතර කළා.

**ගොවි මහත්වරු මේ විදියට අඩු තරමේ පැමිණිලි විදිහට වත් අළුත් වී ජාති ගැන අපි එක්ක තොරතුරු හුවමාරු කරගන්න එක හරි වැදගත්. අපිත් සතුටුයි. මොකද වැඩේ හරියට කෙරෙන්න නම් දෙගොල්ලා උනන්දු වෙන්න එපායැ. කොයි එකටත්**

**අපි කුඹුරු දිහාවේ යමු. සේනාධීර මහතා එක්ක අපිත් එළියට ආවා.**

බතලගොඩ කුඹුරු අක්කර 53 ක යායක්. අපි සාමාන්‍යයෙන් කනනයකට වී ජාති තුන් හාර සියයක් තරම වපුරනවා. ඇත්ත වම අපි ළඟ වී ජාති 800 ක් තරම් තියෙනවා. පැරකුම් රජකාලේ ලංකාවේ වපුරපු වී එහෙම. සමහර වී ජාතිවලට අවුරුදු දහක විතර ඉතිහාසයක් තියෙනවා. මුරුංගා, මාවී, ඇල්වී, රත්රුවන්, සුදු මුරුංගා, මසුරන්, පොලොං වී, සුදුරු සම්බා, කළු සම්බා ඔය පරන වී ජාති ටිකක්. මේ වී ජාති අභාවයට යන්න නොදී රැකගැනීම බතලගොඩින් සිදු කරන තවත් සේවයක්. අපි ඒ වී ආරක්ෂා කරගත්තෙ මෙහෙමයි.

**බතලගොඩ පැරණි සිංහල වී ජාති 800 ක් පමණ අවුරුදු පතා වගා කරන බව කීවොත් ඔබ පුදුම වේවි. පැරකුම් යුගයේ වී ජාති එහෙමත්. ඇයි මෙතරම් අමාරුවෙන් වී ජාති 800 ක් වගා කරන්නේ. මෙහෙම නොක-ළොත් මේ වී ජාති නැත්තටම නැතිවෙන හින්දයි. කීඩෑ උවදුරට ගොදුරු නොවන වී ජාතිත් මේ අතරේ වෙනවා.**

අපට ශීත ගබඩා පහසුකම් නැහැ. ඒ නිසා ඉතින් වී කල් තියාගන්නත් අමාරුයි. හොඳ ශීත කාමර තියෙනවා නම් වී අවුරුදු 6–20 දක්වා වුනත් තියාගන්න පුළුවන්. ඒ නිසා කන්න මාරුවෙන් මාරුවට වගේ මේ පරණ වී ගොවිතැන් කරනවා. ඒවායේ අතීත විස් තරත් අපි ළඟ තියෙනවා. කොළවල, දිග, පළල, පාට, වී ඇට වගේ දේ ගැන. අළුතින් වගා කරාම තත්වය පරණ වාර්තා එක්ක සසඳිලා බලනවා. සමාන නම් පරන වී අයින් කරලා අළුත් වී තියා ගන්නවා. සාමාන්‍යයෙන එක ජාතියකින් පැල විසි පහකට තිහකට වඩා හදන්නේ නැහැ. අක්කර විස්සක පමණ මේ සිංහල වී ගොවිතැන කෙරෙනවා.

**රටපුරා සොයලයි මේ පරන වී එකතු කර ගත්තේ. හුහක් පරණ වී ජාති තමන් ළඟ තිබේනම් අපිටත් දෙන එක ගොවි මහත්වරුන්ගේ යුතුකමක්. අප ඒවා මෙහේ ජාතික වස්තුන් හැටියට රැකගන්න හින්ද. මේ කාලේ ගොයම කීඩෑවන්ට ගොදුරු වුනානේ. ඒත් රතු හීනටි, සුදුරු සම්බා, හීන් රත්කන්ද යන වී ඒකට යටවුනේ නැහැ. ඒක ලොකු දෙයක්. ඒත් ඉතින් ඒවා අස්වැන්න අඩු එක තමයි ප්‍රශ්නේ.**

අපේ කුඹුරුවල වැඩ කරන ගොවි මහත් වරු ගොවිලියෝ හොඳ පුරුදු කාරයෙ. ඒක අපේ වැඩට ලොකු පහසුවක්. වී අභිජනන වැඩ එහෙම එයාලා හොඳට දන්නවා. හුහාක් පරාගණ වැඩත් එයාලා කරනවා. කුඹුරු යායේ විස්තර දක්වමින් එයා කිව්වා.

එයින් මෙයින් අප හැට ගණන් වලට ආවානේ. මේ කාලේ කාගේත් උනන්දුව යොමුවූයේ වගා අක්කර ගණන වැඩි කිරීම කිරීම ගැන නොවෙයි. තියන ගණනින් වැඩි පලදවක් නැති නම් අස්වැන්නක් ගැනීම ගැනයි. වැඩිවන ජනගහනයට ආහාර සැප යීම ඉටුකර ගන්න පුළුවන් මේ ආකාරයටයි. අපේත් පරීක්ෂා ඒ පැත්තට නැඹුරු වුනා. වැඩි අස්වනු වී ගැන. හැට අටේදී රට වීයක් මෙහාට දුන්නා. අයි ආර් 8. ඒක පිලිපීනයේ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ස්ථානයේ නිපදවීමක්. අක්කරයකට බුසල් 125 ක් විතර ගත්තා. ඒත් වගා පිළිවෙත් හා වල් පැලෑටි මර්ධන වැඩවල අඩු ලුහුඬු කම් නිසා අයිආර් 8 අපෙන් ඈත් වුනා.

ඔන්න දැන් අපි කතාවේ වර්තමානයටයි එන්නේ. කෙළින්ම බීජී වලට. මෙච්චර කල අපි හදපු වී 'එච්' නමිනුයි හැඳින්නුවේ. බතලගොඩ වීයක් බව දැක්වීම සඳහා 'එච්' වෙනුවට 'බීජී' යොද ගත්තා. 1970 දී බීජී–11 ගොවි මහත්වරුන්ට දුන්නා. අක්කරයකට බුසල් 100 ක් විතර ගන්න පුළුවන් වුනා. මැලේසියානු වීයක් හා අපේ එච්. 8 දෙමු

* එච් 7 වී බොල් වැඩි ඇයි?
* බීජී 90—2, බිත්තර පැල වී මැරීමට හේතු.
* කීඩෑවාට ගොදුරු නොවෙන අළුත් වී ජාතියක්?

හුන් කරලා මේක හදගත්තේ. මාස හතරක වියක්. 1971 දී බීජී 34–6 රතු නැතිනම කැකුළු හාලක්. අක්කරයකට බුසල් 80. ඊළඟට බීජී 34–8 මාස තුනේ වියක්. බීජී 32–5, 1972 දී ගොවි මහත්වරුන්ට දුන්නා.

1974 දී බීජී 90–2 නැතිනම් අපේ විස්කම් වී ජාතිය ගොවි මහත්වරුනට දුන්නා. ඉන්දුනිසියාවේ රෙමජ්ජා හා ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනයේ අයිආර් 262 අභිජනනය කරලයි බීජී 90-2 හැදුවේ. සේනාධිර මහත්තයා ලොකු සතුටකින් තමයි බීජී 90–2 කතා කළේ. ඇත්තටම මෙච්චර කල් වී වලින් අපි ගන්න අස්වැන්න ගොවි මහත්වරුන්ට ගන්න බැරිවුනා. බීජී 90–2 ඒ බැම්මත් කැඩුවා. නිකවැරටියේ ගොවිමහත්තයෙක් අපේ අස්වැන්නම ගත්තා බීජී 90–2 න්. අපේ ගණන බුසල් 140–160 ත් අතර. එයා සාමාන්‍ය ගොවි මහත්තයෙක්. එයත් බුසල් 150 ක් ගන්නවා. ඒක ලොකු දෙයක්. නියම විදියට ගොවිතැන උනන්දුවකින් කරනවා නම් මෙහෙම අස්වනු ගන්න එක අපහසු නැහැ. අපි නිකම් ගන්න පුළුවන් ගණන පෙන්වලා ඉන්නවාට වඩා ගොවි මහත්වරුන් ඒ ගණන ගන්නවා දකින එක තරම් සතුටක් අපට නැහැ. අපේ උත්සාහය අපතේ නොගිය පෞද්ගලික සතුටට පමණක් සීමාවූ නොවූන දෙයක් වෙන්නේ රටම ඒකෙන් ප්‍රයෝජන ගන්න කොටනේ.

**1975 දී බීජී 90–2 ලොව පුරා කතාබහට ලක්වුන වියක්. ලෝකයේ නොයෙකුත් වී ජාතිවල අස්වැන්න ප්‍රමාණ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය හොයලා බලනවා. 1975 ලෝකයේ සාමාන්‍ය අස්වනු ප්‍රමාණය වුනේ අක්කරයකට බුසල් 120 ක් පමණ. බීජී 90–2 140 ක්. ඒ අනුව 1974 ලෝකයේ වැඩිම අස්වනු විය වුනේ බීජී 90–2. උත්සාහයේ හැටියට ප්‍රතිඵල වගේ. වැඩි අස්වනු ගන්න වැඩියෙන් වියදම් කරන්න ඕන. මේ අලුත් වී වලටත් එහෙමයි. පෝර, බෙහෙත් වගේ යෙදවුම් වලට හරි වියදම් නේ. ඉතින් අපි දැන් වැඩි අස්වනු වී නිපදවීමට වඩා වියදම් අඩු වී ගැනයි උනන්දු වෙන්නේ.**

දැන් බතලගොඩ තියෙන වී ජාති කෙලින්ම ගොවි මහත්වරුන්ට ගන්න බැරිද? අපි ඇහුවා. පුළුවන් ඇත්තෙන්ම අළුත්ම වී වුනත් පුළුවන්. අපි පරීක්ෂා කරන අතර 'ආදර්ශ කට්ටි' හැටියට ගොවි මහත්වරුන්ටත් ඒවා අත්හද බලන්න පුළුවන්. ඔය සමහර කුඹුරු යායවල බෝඩ් ගහපු කුඹුරු කැලි තියෙන්නේ. ඒ ආදර්ශ අත්හද බැලීම් කුඹුරු තමයි. එහෙම කරන්න ගොවි මහත්වරු උනන්දු වෙනවා නම් ඒක ලොකු සේවයක් වෙනවා. එකක් වී පැතිරී යාමට යාමට හේතු වෙනවා. අනික එයාලා මුහුණ පාන ප්‍රශ්න අපට කෙළින්ම දැන ගන්නත් පුළුවන්. අපි එක්ක සම්බන්ධය තියෙන නිසා.

බීජී 90–2 ගැනත් ඔය විදියට පැමිණිල්ලක් ආවා. බීජී 90–2 බිත්තර වී වැපුරුවාම ගොයම් පැලය හැදිලා ටික දිනකින් මැරෙනවා කියලා.

අපි මේක ගැන හෙව්වා. හේතු දෙකක් තියෙනවා. එකක් දැන් හුඟක් ගොයම් පාගන්නෙ ට්‍රැක්ටර් වලින්. බීජී 90–2 කියලා, දැනගත්තම ට්‍රැක්ටර් කාරයෝ ටයර්වල හොඳට හුළං ගහගෙන ඇවිත් පාගලා දමනවා. ටයර්වල දැඩි පීඩනය නිසා වී ඇටය ඇතුලෙන් තුනට හතරට කැඩෙනවා. ඉතින පැල වුනාම මුල් කොටසේ කැම පැලයට ලැබෙන තුරු පැලය හැදෙනවා. මුල් කෑඩීම සමඟම කෑම සැපයීම නවතින නිසා පැලය එතනින්ම මැරෙනවා. බිත්තර වී ගන්න අදහස් කරන වී ගොයම් පෑගීමේදී මේක සැලකිල්ලට ගන්න ඕන. මීහරක්ගෙන් ගොයම් පෑගුවාම මෙහෙම වී ඇටය කැඩීම් හුඟක්ම අඩුයි.